# නීති නිලධාරි - II තනතුරට බඳවාගැනීම - 2023

## ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නීති නිලධාරි II තනතුරේ පවතින පුරප්පාඩු වෙනුවෙන් ස්ථිර පදනමින් බඳවා ගැනීමට දැනට ස්ථිර රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :-**

මෙම තනතුර ස්ථිරය. සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායකත්වය ලබයි.

**සුදුසුකම් :-**

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීති උපාධිය හෝ නීතිඥවරයෙකු වීම (Law or Attorney at law) සහ එම සුදුසුකම් ලැබීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසරක සේවා පළපුරුද්ද.

2. අයදුම්පත් භාරගන්නා දිනට වයස අවු. 45 ට නොවැඩි විය යුතුය.

3. විශිෂ්ට චරිතයකින් හෙබි අයෙකු විය යුතුය.

4. ශ්‍රී ලංකාව තුළ ඕනෑම ස්ථානයක සේවය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවයක් තිබිය යුතුය.

**වැටුප් පරිමාණය :-**

MM 1-1-2016 - (රු. 53,175-10x1375-15x1910-95,575)

මීට අමතරව මූලික වැටුපෙන් 25% දීමනාවක් හා ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

**බඳවාගැනීමේ ක්‍රමය :-**

- පහත දැක්වෙන කරුණු යටතේ පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් සුදුසු අයවලුන් තෝරාගනු ලැබේ.

| | |
|---|---|
| අදාළ අතිරේක අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් | - ලකුණු 30 |
| අදාළ අතිරේක පළපුරුද්ද | - ලකුණු 30 |
| වෙනත් සුදුසුකම් | - ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | - ලකුණු 25 |

සුදුසු අයවලුන් තෝරා ගැනීමේදී, අයදුම්කරු විසින් සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් ලකුණු, අයදුම්කරු විසින් ඉල්ලා සිටිනු ලබන සේවා ස්ථානය හා පුරප්පාඩු සංඛ්‍යාව (භාෂා මාධ්‍යයට අනුව) සළකා ප්‍රමුඛතාවය සකස් කරනු ලැබේ.

| සේවා ස්ථානය | පුරප්පාඩු සංඛ්‍යාව (භාෂා මාධ්‍යයට අනුව) | | මුලු පුරප්පාඩු ගණන |
|---|---|---|---|
| | සිංහල | දෙමළ | |
| 1. ප්‍රධාන කාර්යාලය - කොළඹ | 3 | 3 | 6 |
| 2. බදුල්ල | 1 | - | 1 |
| 3. අනුරාධපුරය | 1 | - | 1 |
| 4 වවුනියාව | - | 1 | 1 |
| 5. යාපනය | - | - | - |
| 6. ත්‍රිකුණාමලය | - | 1 | 1 |
| 7. කල්මුනේ | - | - | - |
| 8. මාතර | - | - | - |
| 9. මඩකලපුව | - | 1 | 1 |
| 10. මහනුවර | - | 1 | 1 |
| 11. අම්පාර | 1 | - | 1 |

ඉහත පරිදි සුදුසුකම් ලැබුවන් නීති නිලධාරි II ශ්‍රේණිය සඳහා බඳවාගනු ලැබේ. බඳවාගනු ලබන්නන් වසර 3ක පරිවාස කාලයකට යටත් වන අතර, පරිවාස කාලය සාර්ථකව අවසන් කරන අයවලුන් තනතුරේ ස්ථිර කිරීමට කටයුතු කරනු ලැබේ.

තනතුරේ උසස්වීම් හා අනෙකුත් ප්‍රතිලාභ නීති නිලධාරි තනතුරේ බඳවාගැනීමේ පරිපාටියට අනුව සිදු කරනු ලැබේ.

පහත දැක්වෙන ආකෘතිය අනුව A4 ප්‍රමාණයට සකස් කර සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2023/03/30** දිනට පෙර ලේකම්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, අංක 14, ආර්.ඒ. ද මෙල් මාවත, කොළඹ 04 ලිපිනයට ලැබෙන සේ තැපැල් මඟින් යොමුකළ යුතු වේ.

ලේකම් (වැ/බ),
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.